**ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය - 2024**
**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක්වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවටවන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක අධිකාරිය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපත්ති අංක 10 අනුව, ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතිය සියටට 20 අනුපාතයට ක්ෂය කළ යුතු නමුත් 2022 වර්ෂයේදී ක්ෂය සඳහා සියයට 10 අනුපාතය අදාළ කර ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වර්ෂයේදී ක්ෂය රුපියල් 5,485,855 කින් අඩුවෙන් සටහන් කර තිබුණි. එම හේතුවෙන්,ඉහත අයිතමයේ ක්ෂය වෙන්කිරීම එම අගයෙන් අඩුවෙන් දක්වා ඇති අතර, සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා ඇත. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි.මූල්‍ය ප්‍රකාශන තුළ ක්ෂය ගැලපුම් කිරීමට අදාළ නිළධාරීන්ට උපදෙස් දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ප්‍රතිපත්ති සහ ප්‍රමිතියේ අවශ්‍යතාවයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| (ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් අංක 13 ට අනුව, ඛනිජතෙල් දත්ත මිලදී ගැනීම් ලෙස දක්වා ඇති වත්කම් පසුගිය වර්ෂ කිහිපයක් පුරා අදායම් උපයා නොමැති බැවින් අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් මගින් වර්ෂ 10 ක් තුළ දත්ත වත්කම් සඳහා හානිකරණය සඳහා සමාලෝචනය කර ඇති බව දක්වා තිබුණි. කෙසේනමුත්, රුපියල් 926,500,000 මිලදී ගත් ඛනිජතෙල් දත්ත වත්කම් සඳහා හානිකරණ පරීක්ෂාවක් කර නොතිබුණි. | මිලට ගත් ඛනිජතෙල් දත්ත වත්කම් වර්ෂ 10 ක් තුළ හානිකරණය සඳහා සමාලෝචනය කරනු ලැබුවත් පසුගිය වර්ෂ වල එය PDASL ට කිසිම ආදායමක් ජනනය කර නොමැත. | මූල්‍ය ප්‍රකාශන ප්‍රතිපත්ති සහ ප්‍රමිතියේ අවශ්‍යතාවයන් අනුකූලව හානිකරන පරීක්ෂාව සිදු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම් ගණනය කිරීමේදී, මූලික වැටුපට වාර්ෂික වැටුප් වර්ධකය සලකා බලා නොමැති අතර, ජීවන වියදම් දීමනාව අඩුවෙන් ගණනය කිරීම සඳහා යොදා ගෙන තිබුණි. එම හේතුවෙන්, පාරිතෝෂික වියදම සහ පාරිතෝෂික සඳහා වෙන්කිරීම් රුපියල් 628,914 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ.මූල්‍ය ප්‍රකාශන වල පාරිතෝෂික අඩුවෙන් දැක්වීම නිවැරදි කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ගණනය කිරීම නිවැරදි තොරතුරු මත පදනම් විය යුතු අතර ප්‍රමිතියේ අවශ්‍යතාවයන්ට අනුගත විය යුතුය. |
| (ආ) පාරිතෝෂික ගෙවීමේදී රු.227,000 ක් වූ ගෙවිය යුතු පාරිතෝෂික මුදලට පියවියයුතු කාර්යය මණ්ඩල ණය ගලපා තිබුණද, ලෙජර් ගිණුම් වල ගිණුම්ගත කර නොතිබුණි. එම හේතුවෙන්, කාර්යය මණ්ඩල ණය සහ පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම් ගිණුම් එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ.මූල්‍ය ප්‍රකාශන වල පාරිතෝෂික අඩුවෙන් දැක්වීම නිවැරදි කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | සිදු වූ ගණුදෙනු හා සිද්ධීන් අනුව ලෙජර් ගිණුම් ගැලපීම සිදු කළ යුතුය. |

## 1.6 ලැබියයුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 වර්ෂයේදී, මන්නාරම් නොර්වේ සමාගමෙන් ඛනිජතෙල් දත්ත මිලට ගැනීම සඳහා භාණ්ඩාගාර උප ණය අංක 20060400 යටතේ භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 926.5 ක ණයක් ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය වෙත ලබා දෙන ලදී. 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ විධිවිධාන යටතේ, ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය ශ්‍රී ලංකා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අධිකාරිය ලෙස නැවත ස්ථාපනය කරන ලදී. ඒ අනුව, 2021 ඔක්තෝම්බර් 08 දින ශ්‍රී ලංකා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අධිකාරිය සංස්ථාගත කරන විට,රුපියල් මිලියන 243.68 ක් වූ භාණ්ඩාගාර උප ණයෙ මුදලෙහි හි ශේෂය | 2026 වර්ෂයේදී PDASL අවශ්‍ය ආදායම ජනනය කරන්නේ නම් ණය ආපසු ගෙවනු ලැබේ. | මෙම කරුණට අදාළ තොරතුරු (උදා: ණය ගිවිසුම් කොන්දේසි, ජනනය කල ආදායම,අපේක්ෂිත ආදායාම,දත්ත තොරතුරු භාවිත කරන්නන්,අනාගත ලංසුකරුවන්) සුදුසු තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය. |

අධිකාරියේ වගකීමක් බවට පත් විය. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අංක TO/REV/SL/2/91 සහ 2022 ජූලි 01 දිනැති ලිපිය අනුව, ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික ආදායමින් සියයට 10 ක් යොදා ගනිමින් භාණ්ඩාගාර උප ණය පියවිය යුතු බව දක්වා ඇති අතර ,2026 දෙසැම්බර් 31 දිනට හෝ ඊට පෙර ණය සම්පූර්ණයෙන් ගෙවිය යුතු බව දන්වා තිබුණි.කෙසේ නමුත්,අධිකාරිය 2021 සිට 2024 දෙසැම්බර් 31 දක්වා ණය මුදලින් රු.මිලියන 21.51 පමණක් ගෙවා ඇති අතර, ඉතිරි මුදල වන රු.මිලියන 222.17, 2025 සහ 2026 වර්ෂවල ගෙවිය යුතු වෙ.

## 1.7 නීති, රීති, නියෝග සහ කළමනාකරණ තීරණ සමඟ අනුකූල නොවීම

| නීති ,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2021 සැප්තැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසාය සඳහා වූ මාර්ගෝපදේශයේ 3.2 ඡේදය | සෑම වර්ෂයකම වාර්ෂික කාර්යසාධන සමාලෝචන රැස්වීමක් (APRM) පැවැත්වීමට අධිකාරී බලය ලබා දී ඇත.කෙසේනමුත්, අධිකාරිය 2024 වර්ෂය සඳහා APRM පවත්වා නොතිබුණි. | 2024 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව අවසන් කිරීමෙන් පසු, වාර්ෂික කාර්යසාධන සමාලෝචන රැස්වීමට (APRM) ඉදිරිපත් කෙරේ. | මාර්ගෝපදේශයන්හි අවශ්‍යතාවයන් සමඟ අනුගත විය යුතුය. |
| (ආ) 2021 සැප්තැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසාය සඳහා වූ මාර්ගෝපදේශයේ 4.2 ඡේදය | විගණන කමිටුව (AC) අවම වශයෙන් මාස තුනකට වරක් රැස්විය යුතු අතර නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම පහසු කිරීමට රැස්වීම් සටහන් සමඟ එහි නිර්දේශ ඉක්මනින් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය. කෙසේනමුත්, 2024 වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි | මාර්ගෝපදේශයන්හි අවශ්‍යතාවයන් සමඟ අනුගත විය යුතුය. |
| (ඇ) 2021 සැප්තැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසාය සඳහා වූ මාර්ගෝපදේශයේ 2.3 ඡේදය සහ III අතිරේකය. | අධිකාරිය සියළු ප්‍රධාන කටයුතු සඳහා නිසි ලෙස සකස් කරන ලද, යාවත්කාලීන කරන ලද, අනුමත කරන ලද අත්පොත් පවත්වාගෙන යායුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි | මාර්ගෝපදේශයන්හි අවශ්‍යතාවයන් සමඟ අනුගත විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එසේවුවද, අධිකාරිය විසින් අත්පොත් සකස් කර නොතිබුණි. | | |
| (ඇ) 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 2(අ) සහ 14 (1) වගන්ති | ශ්‍රී ලංකාවේ සියළු ඛනිජතෙල් සම්පත් ගවේෂණය, සංවර්ධනය, නිෂ්පාදනයට සහ කළමණාකරණය ආවරණය කරමින් උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය වර්ධනය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට උපදෙස් ලබා දීමට ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් ස්ථාපනය කිරීම අධිකාරියේ එක් අරමුණකි. කෙසේනමුත්, මේදක්වා ප්‍රතිපත්ති උපදේශක කමිටුවක් ස්ථාපනය කර නොමැත. | ගරු බලශක්ති අමාත්‍යවරයා විසින් ප්‍රතිපත්ති උපදේශන කමිටුව පත් කිරීම සිදුකරණු ලබයි . | මෙම කරුණට අදාළ තොරතුරු (උදා: කාර්යය සාදනය ප්‍රමාද වීමේ හේතු ) සුදුසු තීරණ ගැනීම සඳහා අධ්‍යක්‍ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය වියදම ඉක්මවූ ආදායම ලෙස රු. 162,853,438 ක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූපීව වියදම ඉක්මවූ ආදායම රු.114, 671,819ක් විය. එබැවින් රු.48,181,619 ක පිරිහීමක් නිරීක්ෂණය කරන ලදී. මෙම පිරිහීම සඳහා හේතු වූයේ පසුගිය වර්ෂය හා සසඳන කළ පරිපාලන හා ආයතන වියදම් වැඩිවීම වේ.

**2.2 ප්‍රධාන ආදායම් වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයන්, ඉකුත් වර්ෂයන් හා සසදා වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය පිලිබඳ පහත සඳහන් පරිදි විශ්ලේෂණය කරන ලදි.

| අදාළ අයිතම | 2024<br>රු.000’ | 2023<br>රු.000’ | විචලනය<br>රු.000’ | ප්‍රතිශතය<br>% |
|---|---|---|---|---|
| අග්‍රිමය | 24,133 | 8,600 | 15,533 | 181 |
| අනෙක් ආදායම් | 1,390 | 6,920 | (5,530) | (80) |
| විදේශ විනිමය ලාභ /අලභ | (7,312) | (22,436) | (15,124) | 67 |
| පරිපාලන සහ ආයතන වියදම් | 177,581 | 96,917 | 80,665 | 83 |
| මූල්‍ය සහ අනෙක් වියදම් | 3,483 | 10,840 | (7,356,) | (68) |
| වියදම ඉක්මවා ආදායම | (162,853) | (114,672) | (48,182) | 42 |

## 2.3 අනුපාත විශ්ලේෂණය

වර්ෂ තුනක් සඳහා අනුපාත පහත පරිදි වේ.

| අනුපාත | 2024 % | 2023 % | 2022 % |
|---|---|---|---|
| | | | -15.74 |
| ශුද්ධ ලාභ/අලාභ අනුපාතය | -674.82 | -1333.39 | |
| ජංගම අනුපාතය | 11.59 | 6.93 | 6.55 |
| වත්කම් මත ප්‍රතිලාභ (ROA) | -15.74 | -9.59 | |
| ණය හිමිකම් අනුපාතය | 0.32 | 0.3 | -1.01 |
| | | | 0.28 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරියේ ජංගම නොවන වත්කම් යටතේ ඛනිජ තෙල් දත්ත මිලදී ගැනීම ලෙස. රුපියල් මිලියන 926.5 ක වටිනාකමක් දක්වා ඇති අතර, මෙම දත්ත 2001 වර්ෂයේදී නොර්වේ හි TGS-NOPEC Geophysical Company ASA සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාව අතර ඇති කර ගත් ගිවිසුම අනුව, ශ්‍රී ලංකාවේ මන්නාරම් ද්‍රෝණියේ ඛනිජ තෙල් සම්පත් ගවේෂණය කිරීමේ සමීක්ෂණ දත්ත නියෝජනය කරයි. 2006 වර්ෂයේදී ශ්‍රී ලංකා රජය ඉහත විදේශ සමාගමින් දත්ත මිලදි ගැනීමට රුපියල් මිලියන 926.5 ක ගෙවන ලද මුදල තවද, ආරක්ෂිත ක්‍රමවේදයක් ලෙස මෙම දත්ත විදේශ සමාගමක සුරක්ෂිතාගාරයක මෙම දත්ත ගබඩා කර ඇති අතර, වාර්ෂිකව රුපියල් 345,321 ගාස්තුවක් ගෙවනු ලැබේ.2021 වර්ෂයේදී, මෙම ඛනිජ තෙල් දත්ත විකිණීමෙන් ලද අදායම ලෙස අධිකාරිය රුපියල් මිලියන 223.43 ක් ජනනය කර ඇත. කෙසේනමුත්, 2022,2023 සහ 2024 වර්ෂ වල ආදායමක් උපාය නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. 2026 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කළ මන්නාරම් ද්‍රෝණියේ අලෙවි වැඩසටහන් සහ ලියාපදිංචි කටයුතු සිදු කිරීමේදී ඛනිජ තෙල් දත්ත විකිණීමට බලාපොරොත්තු වේ. | මෙම කරුණට අදාළ තොරතුරු (උදා: ජනනය කල ආදායම,අපේක්ෂිත ආදායාම,දත්ත තොරතුරු භාවිත කරන්නන්,අනාගත ලංසුකරුවන්) සුදුසු තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය. |

### 3.2 මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කලමකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලය තනතුරු 33 කි. නමුත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කල කාර්යය මණ්ඩලයේ අන්තර්ගත මුල්‍ය අධ්‍යක්‍ෂක, නීති සහ අනුකූලතා අධ්‍යක්‍ෂක සහ මානව සම්පත් කළමනාකරු වැනි ප්‍රධාන තනතුරු 2021 වර්ෂයේ සිට පුරප්පාඩු වි පවතී. 2025 අගෝස්තු මාසයේදී සත්‍ය කාර්යය මණ්ඩලය සහ පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙලින් 06 ක් සහ 27 ක් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, අධිකාරියේ ක්‍රියාකාරි සැලැස්මේ අරමුණු හා කාර්යයන් අපේක්ෂිත පරිදී ලඟා කර ගැනිමට නොහැකි වි තිබුණි. | 2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 35 කි. නම් කරන ලද තනතුරු ඇතුළුව කාර්යය මණ්ඩලයට 09 ක් බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය දී ඇත. | අවම වශයෙන්, ප්‍රධාන තනතුරු බඳවා ගැනීමට අනුමැතිය, අදාළ අධිකාරිත්වයෙන් ලබා ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |